# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## අවස්ථා කළමනාකරණය – DIEM 22072

කාලය :- පැ 02

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත ය.
❖ <u>පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක්</u> පිළිතුරු සපයන්න.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

01. i. අවස්ථාවක් යනු කුමක්දැයි හඳුන්වන්න. *(ලකුණු 02)*

ii. අවස්ථා කළමනාකරණයේ මූලිකාංග 07 දක්වන්න. *(ලකුණු 03)*

iii. ප්‍රාසංගික අවස්ථාවක් සඳහා යෝග්‍ය අවස්ථා කළමනාකරණ ක්‍රියාවලියක පියවර විස්තර කරන්න. *(ලකුණු 20)*

(ලකුණු 25)

02. අවස්ථා කළමනාකරුවෙකු ලෙස ඔබට සැපයුම්කරුවන්, අනුග්‍රාහකයන්, තාක්ෂණික ශිල්පීන් සහ ස්ථාන කළමණාකරුවන් (රංග ශාලා සහ හෝටල්) සමඟ ඇති සම්බන්ධතාවය වැදගත් වන්නේ කෙසේදැයි හඳුන්වන්න. ඔබ එම සම්බන්ධතාව වර්ධනය කරගැනීමට කටයුතු කරන ආකාරය පැහැදිළි කරන්න.

(ලකුණු 15)

03. අවස්ථා කළමනාකරුවාගේ කාර්යභාරයන් 05ක් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 15)

04. ඔබ සාර්ක් (SAARC) රටවල සිට පැමිණීමට නියමිත විදේශිකයින් සියදෙනෙකු සඳහා දේශීය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමේ තෙදින වැඩ සටහනක් සැලසුම් කර සංවිධානය කළ යුතු ව ඇත. එම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබේ අදහස් ඇතුළත් යෝජනාවලියක් පිළියෙල කරන්න.

(ලකුණු 15)

05. අවස්ථාවක් සැලසුම් කිරීමට ප්‍රථම ඊට අදාළ අවස්ථා පරිසරය (Event Environment) විශ්ලේෂණය කිරීමේ වැදගත්කම පහදන්න. (ලකුණු 15)

06. නිර්මාණාත්මක අවස්ථා සංකල්පයක වැදගත්කම පෙන්වා දෙමින්, අවස්ථා සංකල්පයක් නිර්මාණය කිරීමේ දී ඔබ විසින් සැලකිළිමත්වන කරුණු 04 ක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 15)

…………………

2023.06.23